ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 අප්‍රේල් මස 26 වැනි දින |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ 2016 වසර සඳහා වන වාර්ෂික වාර්තාව

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 35 වැනි වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ 67 වැනි වාර්ෂික වාර්තාව මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් ගරු මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතා වෙත පිළිගන්වන ලදී.



(ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් 2016 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව ගරු මුදල් අමාත්‍ය රවී කරුණානායක මහතා වෙත පිළිගැන්වීම. මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ මුදල් මණ්ඩල සාමාජික ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති එස්. ලංකාතිලක මහතා, සහකාර අධිපතිවරුන් වන සී.ජේ.පී. සිරිවර්ධන මහතා හා කේ.ඩී. රණසිංහ මහතා සහ මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා ආචාර්ය යුතිකා ඉන්ද්‍රරත්න මහත්මිය ද ඡායාරූපයේ වෙති.)

**ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹු වන 2016 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.**

**සමස්ත නිරීක්ෂණ :** *ශ්‍රී ලංකා ආර්ථිකය, අවිනිශ්චිත කාලසීමාවකින් පසු 2016 වසර තුළ දී, රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා ප්‍රතිචාර දක්වමින් ක්‍රමයෙන් ස්ථායී බවට පත් වීමේ මූලික ලක්ෂණ පෙන්නුම් කළේය. අයහපත් කාලගුණික තත්ත්වයෙහි බලපෑම හා ගෝලීය ආර්ථිකය සෙමෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් පෙර වසරේ දී වාර්තා කරන ලද සියයට 4.8 ක මූර්ත ආර්ථික වර්ධනය හා සැසඳීමේ දී ශ්‍රී ලංකා ආර්ථිකය 2016 වසර තුළ දී සියයට 4.4 ක මන්දගාමී වර්ධනයක් වාර්තා කළ ද, දැඩි රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීම මධ්‍යයේ පවා වසරේ දෙවැනි කාර්තුවේ සිට ක්‍රමයෙන් ශක්තිමත් වන කාර්තුමය ආර්ථික වර්ධනයක් දක්නට ලැබුණි. විශේෂයෙන්, ඉදිකිරීම් අංශය ප්‍රමුඛ ආයෝජන වියදම ඉහළ යෑම වසර තුළ ආර්ථික වර්ධනයට මූලිකව හේතු වූ අතර, ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම හේතුවෙන් පරිභෝජන වියදමෙහි වර්ධනය මන්දගාමී විය.*

*වසරේ පළමු සිව් මස තුළ අඩු මට්ටමක පැවති උද්ධමනය පසුව ක්‍රමයෙන් ඉහළ ගිය අතර, 2016 වසර අවසානය වන විට ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013 = 100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013 = 100) යන දර්ශක අනුව මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනය සියයට 4.0 ක් විය. 2016 වසරේ ඇතැම් මාසවල මෙන්ම 2017 වසරේ පළමු කාර්තුව තුළ දී ඉහළ උද්ධමනයක් ඇති වීම සඳහා කාලගුණික හේතු නිසා ඇතිවූ අවහිරතාවල අයහපත් බලපෑම, රජයේ බදු සංශෝධන සහ ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතු වුව ද, මූලික උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම තුළින් ආර්ථිකයෙහි ඉහළ යමින් පැවති ඉල්ලුම් පීඩන පිළිබිඹු විය.*

*දේශීය ආර්ථිකයෙහි ඇතැම් අංශ තුළින් ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම, සීමිත දේශීය භාණ්ඩ පැස සඳහා වන විදේශීය ඉල්ලුම දුර්වල මට්ටමක පැවතීම, විදේශීය සෘජු ආයෝජන ප්‍රවාහ ආකර්ෂණය කර ගැනීමට දිගින් දිගටම නොහැකි වීම මෙන්ම, විශේෂයෙන්ම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ මත බලපෑම් ඇති කිරීමට හේතු වූ විදේශ පොලී අනුපාතික ඉහළ යෑමෙහි බලපෑම විදේශීය අංශයෙහි ගිණුම්වල විචලනයන් තුළින් පෙන්නුම් කෙරිණ. සංචාරක ඉපැයීම්, වෙනත් සේවා අපනයන මෙන්ම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම මධ්‍යයේ වුව ද, මෙම අයහපත් ප්‍රවණතා හේතුවෙන් ගෙවුම් තුලනය අඛණ්ඩව දෙවැනි වසරටත් හිඟයක් වාර්තා කළේය. වසරේ පළමු සිව් මස තුළ දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ මහ බැංකුවේ ඉහළ මැදිහත්වීමක් අඛණ්ඩව පැවති අතර, එම නිසා එම කාලය තුළ විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතිණ. කෙසේ වුව ද, ඉන් පසු කාලසීමාවේ දී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇති වන පීඩනය මැඩපැවැත්වීම සඳහා පමණක් මහ බැංකුවේ මැදිහත්වීම සීමා කිරීම තුළින් විනිමය අනුපාතිකය වැඩි වශයෙන් වෙළඳපොළ තත්ත්වය අනුව හැඩ ගැසීමට ඉඩ සලසනු ලැබිණ.*

*ඉල්ලුම් පීඩන තුළින් උද්ධමනය ඉහළ යෑමට ඇති හැකියාව හේතුවෙන් මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමටත්, දැඩි මුදල් තත්ත්වයක් පවත්වා ගැනීමටත් ශ්‍රී ලංකා මහ බැංකුව වසර පුරා කටයුතු කළේය. ඒ අනුව, 2016 ජනවාරි මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකුවල*

*සියලුම රුපියල් තැන්පතුවලට අදාළ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2015 දෙසැම්බර් මස දී ඉහළ නැංවීම සහ තෝරාගත් සාර්ව විචක්ෂණ ඉල්ලුම් කළමනාකරණ උපකරණයක් ලෙස වටිනාකම මත උපරිම ණය අනුපාතිකයක් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුව, පළමුව, 2016 පෙබරවාරි මාසයේදීත් දෙවනුව, 2016 ජූලි මාසයේදීත් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් දෙවතාවක දී ඉහළ නැංවීය. මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු තුළින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව දක්වා කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවනු ලැබූ අතර, එමගින් වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මුදල් තත්ත්වය ක්‍රමයෙන් දැඩි වීම හේතුවෙන් පුළුල් මුදල් සැපයුම වර්ධනය වීමේ වේගය පාලනය වූ අතර, 2016 වසරේ ජූලි මස දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 28.5 ක ඉහළම වර්ධනයක් වාර්තා කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණයෙහි වර්ධනය ද වසර අවසානය වන විට සියයට 21.9 ක් දක්වා මන්දගාමී විය. කෙසේ වුව ද, මුදල් හා ණය ප්‍රසාරණය පහත වැටීමේ වේගය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පැවතිණ. ඒ අනුව, උද්ධමන අපේක්ෂා කළමනාකරණය සඳහා වැඩි ප්‍රමුඛතාවක් සහිත ඉදිරි කාලීන දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති රාමුවක් තුළ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා මහ බැංකුව, මැදිකාලීන වශයෙන් උද්ධමනය මැදි-තනි අගයක පවත්වා ගැනීමේ සිය අභිලාෂය වෙළඳපොළ වෙත පෙන්නුම් කරමින්, 2017 මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික නැවතත් පදනම් අංක 25 කින් ඉහළ නැංවීය. මේ අතර, විදේශීය හා දේශීය යන දෙඅංශයෙහිම පවතින අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින්, ආර්ථිකයෙහි මූල්‍ය අංශය වසර තුළ දී තවදුරටත් පුළුල් විය.*

*රාජ්‍ය මූල්‍ය කටයුතුවල ආදායම් හා වියදම් යන දෙඅංශයෙන්ම යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරමින් සමස්ත අයවැය හිගය දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.යෙහි) ප්‍රතිශතයක් ලෙස අපේක්ෂිත සියයට 5.4 මට්ටමෙහි රඳවා ගැනීමට හැකි විය. මෙම සුබවාදී වර්ධනය හමුවේ වුවද, සමස්ත සාර්ව ආර්ථික ප්‍රතිපත්ති රාමුව තුළ රාජ්‍ය මූල්‍ය කටයුතු මෙහෙයවීමට ඇති ඉඩකඩ ක්‍රමයෙන් ඇහිරී යෑම පිළිබිඹු කරමින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය ඉහළ යෑම තුළින් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය තිරසාර ලෙස පවත්වා ගැනීමට අඛණ්ඩව ප්‍රයත්න දැරීමේ අවශ්‍යතාව පෙන්නුම් කළේය.*

**මූර්ත අංශයේ වර්ධනයන් : විවිධ ගෝලීය හා දේශීය අභියෝග රැසක් මධ්‍යයේ වුවද, ශ්‍රී ලංකා ආර්ථිකය 2016 වසරේ දී සියයට 4.4 කින් මූර්ත වශයෙන් වර්ධනය විය.**[1] වසර තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය ආර්ථික කටයුතු කෙරෙහි, මූලික වශයෙන් කෘෂිකාර්මික අංශය කෙරෙහි, අහිතකර ලෙස බලපෑවේය. මූල්‍ය සේවා, රක්ෂණ, විදුලි සන්දේශ මෙන්ම ප්‍රවාහන සහ තොග හා සිල්ලර වෙළඳාම යන අංශවල වර්ධනයත් සමඟ මූර්ත ද.දේ.නි.යෙන් සියයට 56.5 ක දායකත්වයක් සහිත සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් 2016 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.2 කින් වර්ධනය විය. ඉදිකිරීම් සහ පතල් හා කැණීම් යන උප අංශ වර්ධනය වීම හේතුවෙන් මූර්ත ද.දේ.නි.යට සියයට 26.8 ක දායකත්වයක් දක්වන කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් පෙර වසරට සාපේක්ෂව සියයට 6.7 ක සැලකිය යුතු වර්ධනයක්

1 2015 ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ ද සඳහන් කර ඇති පරිදි එක්සත් ජාතීන්ගේ 2008 ජාතික ගිණුම් ක්‍රමය (System of National Accounts) අනුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 ජූලි මාසයේ දී ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන සඳහා වන පදනම් වර්ෂය 2002 සිට 2010 දක්වා වෙනස් කරන ලදී. මෙම වැඩිදියුණු කරන ලද ගණනය කිරීමේ ක්‍රමවේදය මගින් පසුගිය දශකයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම් ග්‍රහණය කෙරුණු අතර, ජාතික ගිණුම් ක්‍රමය තුළට නව ආර්ථික කටයුතු හඳුන්වා දෙන ලදී. පදනම් වර්ෂය වෙනස් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මගින් සාර්ව ආර්ථික දර්ශක මත විවිධාකාර බලපෑම් ඇති කරන ලදී. 2015 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවල සඳහන් ශ්‍රී ලංකා ආර්ථික තත්ත්වය පිළිබඳ විශ්ලේෂණ නව තාවකාලික ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

වාර්තා කළේය. කර්මාන්ත අංශය තුළ ඇතුළත් නිෂ්පාදන කටයුතු සියයට 1.7 ක අඩු අගයකින් වර්ධනය විය. කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් 2016 වසර තුළ දී සියයට 4.2 කින් අඩු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ දී එම ක්‍රියාකාරකම් මූර්ත ද.දේ.නි.යට දක්වන දායකත්වය සියයට 7.1 ක් දක්වා අඩු විය. 2016 වසර තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ප්‍රධාන වශයෙන් වී, තේ සහ රබර් යන උප අංශවල වර්ධනය පහළ ගියේය.

**වියදම් ප්‍රවේශයේ ඇස්තමේන්තු සැලකීමේ දී, 2016 වසර තුළ දී ආර්ථික වර්ධනය සඳහා ආයෝජන වියදම් පුළුල් වීම මූලික වශයෙන් හේතු විය.** ඒ අනුව, නාමික ද.දේ.නි.යට සියයට 31.5 ක දායකත්වයක් දක්වන සහ ආර්ථිකයේ ආයෝජන ක්‍රියාකාරකම් මට්ටම පිළිබිඹු කරන දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 19.6 කින් වර්ධනය විය. වසර තුළ දී ඉදිකිරීම් ක්‍රියාකාරකම් පුළුල් වීම ඉහළ ආයෝජන වර්ධනයට මූලික වශයෙන් හේතු විය. මේ අතර, ආර්ථිකයේ විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම්, නාමික වශයෙන් සියයට 4.1 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, එය පෙර වසරේ වාර්තා කළ සියයට 10.3 ක වර්ධනය හා සැසඳීමේ දී සැලකිය යුතු මධ්‍යස්ථ අගයකි. දැඩි මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් පෞද්ගලික අංශයේ පරිභෝජන වියදම අඩු වීම මෙන්ම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව ඇති කිරීම සඳහා දරන ලද ප්‍රයත්න හේතුවෙන් රාජ්‍ය අංශයේ පරිභෝජන වියදම සීමා වීම, 2016 වසරේ දී පරිභෝජන වියදම අඩු වීමට හේතු විය. 2016 වසර තුළ දී දේශීය ඉල්ලුම නාමික වශයෙන් සියයට 8.2 කින් (මූර්ත වශයෙන් සියයට 6.2 කින්) වර්ධනය වුවද, ලෝක අපනයන සඳහා ශ්‍රී ලංකාවේ අපනයන දායකත්වය අඛණ්ඩව පහත වැටීම තුළින් පෙන්නුම් කෙරෙන ආර්ථිකයෙහි තරගකාරිත්වය අඩු වීම සහ මෙරට අපනයන වෙළඳපොළ තුළ පවතින දුර්වලතා හේතුවෙන්, ශුද්ධ විදේශීය ඉල්ලුම නාමික වශයෙන් සියයට 9.6 කින් (මූර්ත වශයෙන් සියයට 22.5 කින්) අඩු විය. මෙම ප්‍රවණතා මධ්‍යයේ වුවද, වසර තුළ දී පෞද්ගලික ඉතුරුම් සහ රාජ්‍ය නිර්ඉතුරුම් යන දෙඅංශයම වර්ධනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස දේශීය ඉතුරුම් ඉහළ යෑම හේතුවෙන්, දේශීය ඉතුරුම් නාමික ද.දේ.නි.යෙන් සියයට 23.8 ක් දක්වා වර්ධනය විය. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම අඩු වුවද, විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසර තුළ දී ජාතික ඉතුරුම් ද වර්ධනය විය. ඒ අනුව, ජාතික ඉතුරුම්, නාමික ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ දී වාර්තා වූ සියයට 26.0 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 28.9 ක් දක්වා වර්ධනය විය. ආයෝජන සහ ඉතුරුම්වල ඉහළ යෑමත් සමඟ, 2016 වසරේ දී දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය මෙන්ම, ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය ද, පිළිවෙළින්, ද.දේ.නි.යෙන් සියයට 7.6 ක් සහ ද.දේ.නි.යෙන් සියයට 2.5 ක් ලෙස පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව පැවතුණි.

**සේවා වියුක්ති අනුපාතිකය පෙර වසරේ දී වාර්තා වූ සියයට 4.7 හා සැසඳීමේ දී 2016 වසරේ දී සියයට 4.4 ක් දක්වා අඩු වූ අතර, ආර්ථිකයේ කර්මාන්ත හා සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් පුළුල් වීමත් සමඟ සේවා නියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව වසර තුළ දී සියයට 1.5 කින් ඉහළ ගියේය.** ස්ත්‍රී හා පුරුෂ සේවා වියුක්ති අනුපාතික, පිළිවෙළින්, 2015 වසරේ දී පැවති සියයට 7.6 හා සියයට 3.0 සමඟ සැසඳීමේ දී 2016 වසරේ දී, පිළිවෙළින්, සියයට 7.0 ක් හා සියයට 2.9 ක් දක්වා අඩු විය. 2016 වසර තුළ දී සියලුම කාණ්ඩවල අධ්‍යාපන මට්ටම් අනුව සේවා වියුක්ති අනුපාතික අඩු වීමක් වාර්තා කළ ද, තරුණ කාණ්ඩ (අවුරුදු 15 - 24) අතර සේවා වියුක්ති අනුපාතිකය 2015 වසරේ දී වාර්තා වූ සියයට 20.8 සිට 2016 වසරේ දී සියයට 21.6 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, 2016 වසරේ දී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 53.8 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි. නුපුහුණු කාන්තාවන් විදේශගත වීම නිසා ඇති වන සමාජීය බලපෑම අවම කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිවලට

ප්‍රතිචාර දක්වමින් සහ බොහෝ මැද පෙරදිග රටවල හා විදේශ රැකියා සපයන අනෙකුත් රටවල ආර්ථික ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් 2016 වසරේ දී විදේශ රැකියා සඳහා යොමු වීමේ අඩුවක් දක්නට ලැබිණ. කෙසේ වුව ද, පුහුණු කාණ්ඩයේ තාවකාලික සංක්‍රමණිකයන්ගේ ඉහළ යෑම, ප්‍රේෂණවල මධ්‍යස්ථ වර්ධනයක් සඳහා හේතු විය. මේ අතර, 2016 වසරේ පළමු කාර්තු තුන තුළ දී ශ්‍රම ඵලදායිතාව සුළු වශයෙන් ඉහළ ගියේය. කෘෂිකාර්මික අංශයේ ශ්‍රම ඵලදායිතාව, කර්මාන්ත හා සේවා අංශවලට සාපේක්ෂව සැලකිය යුතු අඩු මට්ටමක පැවතුණි.

*උද්ධමනය* **: 2016 වසරේ මුල් භාගය තුළ දී පාරිභෝගික මිල උද්ධමනය ඉහළ ගිය ද, වසරේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ දී එය තරමක් දුරට ස්ථාවර වීමක් පෙන්නුම් කළ අතර, 2016 වසරේ දී මූලික උද්ධමනය සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් පහළ අගයක පැවතීම මත ආනයන මගින් ඇති කරන ලද අවධමනාත්මක බලපෑමෙහි ප්‍රතිඵලයක් ලෙස ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, වසරේ පළමු කාර්තුවේ දී පහළ අගයක් ගන්නා ලදී. අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් දේශීය සැපයුම් අංශයේ ඇති වූ අවහිරතා සහ බදු සංශෝධනවල බලපෑම පිළිබිඹු කරමින් මතුපිට උද්ධමනය වසරේ දෙවන කාර්තුවේ දී ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වුවත්, රාජ්‍ය බදු ව්‍යුහයෙහි සිදු කරන ලද සංශෝධන ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම මෙන්ම, දේශීය සැපයුම් තත්ත්වය යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් තුන්වන කාර්තුවේ දී උද්ධමනයෙහි යම්කිසි අඩු වීමක් දක්නට ලැබුණි. ඉන්පසුව උද්ධමනය බොහෝ සෙයින් ස්ථාවරව පැවති නමුත්, 2016 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද  එකතු කළ අගය මත නව බදු අනුපාතික හේතුවෙන් මිල මට්ටම් මත පීඩනයක් ඇති විය. ඒ අනුව, 2016 ජුනි මස දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.4 ක උපරිම අගයක් වාර්තා කළ ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2016 වසර අවසානය වන විට සියයට 4.2 දක්වා ක්‍රමයෙන් අඩු වී 2015 වසර අග පැවති මට්ටමට සමාන මට්ටමක පැවතිණ. එවැනිම ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2016 ජූලි මස දී සියයට 5.8 ක් ලෙස ඉහළම අගයක් වාර්තා කළ ද, 2016 වසර අවසානයේ දී සියයට 4.5 ක් විය. ආර්ථිකයෙහි යටිදැරි උද්ධමන පීඩනය මනිනු ලබන මූලික උද්ධමනය, 2016 වසරේ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත්, ඇතැම් මාසවල දී යම් විචලනයන් පෙන්නුම් කළේය. මුදල් හා ණය සමස්ත ඉහළ යෑමෙන් ඇති වූ ඉල්ලුම හේතුවෙන් හටගත් උද්ධමන පීඩනවල බලපෑම, ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩ මිල ගණන් සාපේක්ෂව අඩු මට්ටමක පැවතීම හා පරිපාලිත මිල ගණන් සංශෝධනය කිරීම මගින් යටපත් වුව ද, රජය විසින් බදු ව්‍යුහයෙහි සිදු කරන ලද සංශෝධන හේතුවෙන් 2016 වසරේ මුල් භාගයේ දී මූලික උද්ධමනය ඉහළ ගියේය. බදු ව්‍යුහය සඳහා සිදු කරන ලද සංශෝධන තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස මාස කිහිපයක් පුරා මූලික උද්ධමනය ස්ථාවරව පැවතුණ ද, බදු සංශෝධන යළි ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2016 වසර අග දී මූලික උද්ධමනය ඉහළ ගියේය. ඒ අනුව, ජා.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2015 වසර අවසානයෙහි පැවති සියයට 5.8 ඉක්මවා යමින් 2016 වසර අවසානයේ දී සියයට 6.7 ක අගයක් වාර්තා කළේය. කො.පා.මි.ද. මත පදනම් වූ මූලික උද්ධමනය 2015 වසර අවසානයෙහි පැවති සියයට 6.7 ක මට්ටමේ සිට 2016 වසර අවසානය වන විට සියයට 5.8 දක්වා අඩු විය. ඇඩි මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උද්ධමනය මත ඉල්ලුම් පීඩන බොහෝ දුරට මැඩපැවැත්වීමට හේතු වුවද, පැවති නියං තත්ත්වය, බදු ව්‍යුහයේ සිදු කරන ලද සංශෝධනවල බලපෑම  හා ඉහළ යමින් පවතින ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන්, 2017 වසරේ පළමු කාර්තුව තුළ දී උද්ධමනයෙහි සිදු වූ වෙනස්වීම් කෙරෙහි බලපෑවේය.

***විදේශීය අංශයේ වර්ධනයන් :*** **මධ්‍යස්ථ මට්ටමක පැවති විදේශ විනිමය ලැබීම් ඉක්මවා විදේශ විනිමය ගෙවීම් සිදු වීමත් සමග 2016 වසර තුළ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශයෙහි මන්දගාමී ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පැවතුණි.** ඇමෙරිකා එක්සත් ජනපදයෙහි මුදල් ප්‍රතිපත්තිය ක්‍රමයෙන් දැඩි කිරීම, ඇතැම් දියුණු ආර්ථිකවල සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි ආර්ථික තත්ත්වය මන්දගාමී ලෙස යථා තත්ත්වයට පත් වීම නිසා විදේශීය ඉල්ලුම අඩු වීම සහ මැද පෙරදිග රටවල අඛණ්ඩව පැවති භූ-දේශපාලනික අවිනිශ්චිතතාව හේතුවෙන් විදේශීය අංශයෙහි ක්‍රියාකාරිත්වය සැලකිය යුතු ලෙස පසුබෑමකට ලක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2015 වසරේ පැවති සියයට 10.4 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 11.2 ක් දක්වා පුළුල් විය. සේවා ගිණුම සහ ද්විතීයික ආදායම් ගිණුම අතිරික්තයන් වාර්තා කළ ද, වෙළඳ හිඟය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ඉහළ යෑම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ජංගම ගිණුමේ හිඟය 2015 වසරේ පැවති සියයට 2.3 සිට 2016 වසරේ දී සියයට 2.4 ක් දක්වා පුළුල් විය. ණය නොවන විදේශීය විනිමය ලැබීම් අඩු වීම හමුවේ ණය ආපසු ගෙවීම් වශයෙන් සිදු කරන ලද අඛණ්ඩ ගෙවීම් හේතු කොට ගෙන ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමෙහි ක්‍රියාකාරිත්වය මන්දගාමී විය. 2016 වසරේ ජූලි මාසයේ දී ශ්‍රී ලංකාව සිය දසවන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය මගින් එ.ජ. ඩොලර් මිලියන 1,500 ක් ලබා ගත් අතර, එය ද්විත්ව කල් පිරීමේ කාලයක් සහිතව නිකුත් කළ පළමු ස්වෛරීත්ව බැඳුම්කරය විය. මේ අතර, ගෙවුම් තුලනය පිරිහීම වැළැක්වීම සහ රජයේ ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළට සහාය ලබා ගැනීම යන අරමුණු ඇතිව ශ්‍රී ලංකාව ජා.මූ. අරමුදල වෙතින් විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) බිලියන 1.1 ක (ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 1.5 ක) තුන් අවුරුදු විස්තීර්ණ ණය පහසුකමක් ලබා ගත් අතර, 2016 වසර තුළ දී එහි පළමු හා දෙවන වාරික ලෙස එ.ජ. ඩොලර් මිලියන 332 ක් ලැබිණි. ජංගම ගිණුමේ හිඟය පුළුල් වීම සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සාපේක්ෂ වශයෙන් අඩු මට්ටමක පැවතීම පිළිබිඹු කරමින් 2016 වසරේ දී ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂයෙහි හිඟයක් වාර්තා විය. 2015 වසරේ දී වාර්තා වූ සමස්ත හිඟය වන එ.ජ. ඩොලර් මිලියන 1,489 ට සාපේක්ෂව, 2016 වසරේ දී සමස්ත හිඟය එ.ජ. ඩොලර් මිලියන 500 ක් විය. මේ අතර, 2016 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ සංචිත වත්කම් තත්ත්වය, භාණ්ඩ ආනයනික මාස 3.7 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 3.1 කට සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 6.0 දක්වා පහත වැටුණි. විදේශ විනිමය ණය සේවාකරණ ගෙවීම්, විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පියවීම, ජා.මූ. අරමුදලේ සමීපස්ථ ණය පහසුකමෙහි ගෙවීම් සහ විශේෂයෙන්ම, වසරේ පළමු භාගයේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළට ද්‍රවශීලතාව සැපයීම, දළ නිල සංචිතවල මෙම අඩු වීම සඳහා මූලික වශයෙන්ම හේතු විය. 2016 වසර අවසානයේ දී මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, භාණ්ඩ ආනයනික මාස 5.2 ක් හා භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.3 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 8.4 ක් විය. 2016 වසරේ දී ස්ටර්ලින් පවුම හැර අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. ආනයන ඉහළ යෑම, අඛණ්ඩව සිදු කරන ලද ණය සේවාකරණ ගෙවීම් සහ එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම මධ්‍යයේ දේශීය රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ආපසු ගලා යෑම රුපියල අවප්‍රමාණය වීමට පැවති පීඩනය සඳහා හේතු විය. මහ බැංකුව විසින් වසරේ පළමු මාස හතර තුළ දී වෙළඳපොළට විදේශ විනිමය විශාල වශයෙන් සපයන ලද අතර, ඉන් අනතුරුව විදේශ විනිමය සැපයීම අඩු වශයෙන් සිදු කරන ලදී. ඒ අනුව, 2015 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 3,250 ක ශුද්ධ විදේශ විනිමය සැපයුමට සාපේක්ෂව මෙම වසර තුළ එ.ජ. ඩොලර් මිලියන 768 ක ශුද්ධ විදේශ විනිමය සැපයුමක් මහ බැංකුව විසින් සිදු කරන ලදී. මූලික වශයෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි ආයෝජන, විදේශීය ආයෝජකයන් විසින් ඉවත් කර ගැනීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය අවම කිරීමට මහ බැංකුව විදේශ විනිමය වෙළඳපොළ තුළ මැදිහත් වීම මේ සඳහා හේතු විය. වසරේ

පළමු මාස හතර තුළ මහ බැංකුව විසින් දේශීය විනිමය වෙළඳපොළ තුළ සිදු කරන ලද මැදිහත්වීම හේතුවෙන් සමස්තයක් ලෙස ස්ථාවරව පැවති රුපියල, වසරේ දෙවන භාගය තුළ වෙළඳපොළ ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් බොහෝ දුරට පිළිබිඹු වන ලෙස විචලනය වීමට ඉඩ හැරීම හේතුවෙන්, 2016 වසර තුළ එ.ජ. ඩොලරයට එරෙහිව රුපියල සියයට 3.83 කින් අවප්‍රමාණය විය. රුපියල නාමිකව අවප්‍රමාණය වුවත්, විදේශීය තරගකාරී බව පහළ යෑම පිළිබිඹු කරමින් නාමික විනිමය අනුපාතිකවල වෙනස්වීම් සහ රටවල් අතර උද්ධමන වෙනස්වීම් සැලකිල්ලට ගැනෙන මුදල් වර්ග 5 කින් සහ මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශක වසර අවසානය වන විට, පිළිවෙළින්, සියයට 2.83 කින් සහ සියයට 2.70 කින් අතිප්‍රමාණය විය.

***රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්* : රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා වන රජයේ කැපවීම හේතුකොට ගෙන බදු පදනම පුළුල් කිරීම, බදු පරිපාලනය හා සම්බන්ධ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම තුළින් රාජ්‍ය ආදායම ඉහළ යෑම සහ රජයේ වියදම් තාර්කීකරණය කිරීම 2016 වසර තුළ රාජ්‍ය මූල්‍ය අංශයේ සිදුවූ සමස්ත වර්ධනයට දායක විය.** ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් තුළින් අත් කර ගත් රාජ්‍ය මූල්‍ය අංශයේ යහපත් වර්ධනය හේතුවෙන් අයවැය හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ සියයට 7.6 හා සැසඳීමේ දී 2016 වසරේ දී ඉලක්කගත මට්ටම වූ සියයට 5.4 ක මට්ටමේ රඳවා ගැනීමට හැකි විය. ඒ හා සමගාමීව, රජයේ නිර්ඉතුරුම් පිළිබිඹු කරනු ලබන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ වාර්තා වූ සියයට 2.3 සිට 2016 වසරේ දී සියයට 0.6 දක්වා සැලකිය යුතු ලෙස අඩුවිය. සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කිරීම මගින් ගණනය කරනු ලබන ප්‍රාථමික ගිණුමේ හිඟය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ වාර්තා වූ සියයට 2.9 සිට 2016 වසරේ දී සියයට 0.2 දක්වා අඩු විය. 2015 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.3 ක් වූ රාජ්‍ය ආදායම 2016 වසරේ දී සියයට 14.2 ක් දක්වා දෙවන වසරටත් ඉහළ ගිය අතර, රජයේ බදු නොවන ආදායම ඉහළ යෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 වසර තුළදී, බදු ආදායම සියයට 8.0 කින් ඉහළ ගිය ද, බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ පැවති සියයට 12.4 මට්ටමේ පැවතිණි. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස බදු නොවන ආදායම 2015 වසරේ වාර්තා වූ සියයට 0.9 සිට 2016 වසරේ දී සියයට 1.9 දක්වා ඉහළ ගිය අතර, නාමික වශයෙන් ද එය දෙගුණයකටත් වඩා වැඩි අගයකින් ඉහළ ගියේය. බැංකු හා රක්ෂණ අංශ සහ ශ්‍රී ලංකා විදුලි සන්දේශ නියාමන කොමිෂන් සභාව ආදියෙහි ඉහළ කාර්යසාධනයෙහි ප්‍රතිඵලයක් ලෙස රජය සතු වාණිජ ව්‍යවසාය වෙතින් ලද ලාභ හා ලාභාංශ පැවරුම් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රජයේ මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස බදු ආදායම සියයට 86.8 ක් වූ අතර, රජයේ බදු ආදායම සඳහා ප්‍රධානතම දායකත්වය දරන වක්‍ර බදු ආදායම බදු ආදායමෙන් සියයට 82.3 ක් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මුළු වියදම හා ශුද්ධ ණයදීම් 2015 වසරේ වාර්තා වූ සියයට 20.9 සිට 2016 වසරේ දී සියයට 19.7 දක්වා අඩු වූ අතර, පුනරාවර්තන වියදම් මෙන්ම ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණයදීම්වල පහළ යෑම එමගින් පිළිබිඹු විය. පුනරාවර්තන වියදම් තාර්කීකරණය කිරීම සහ ප්‍රාග්ධන වියදම් ප්‍රමුඛතාව මත සිදු කිරීම සඳහා දරන ලද රජයේ ප්‍රයත්නය හේතුවෙන් රජයේ වියදම් අඩු විය. ඒ අනුව, පුනරාවර්තන වියදම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2015 වසරේ වාර්තා වූ සියයට 15.5 සිට 2016 වසරේ දී සියයට 14.8 දක්වා අඩු විය. කෙසේ වෙතත්, පුනරාවර්තන වියදම් නාමික වශයෙන් 2016 වසරේ දී සියයට 3.3 කින් ඉහළ ගිය අතර, පොලී ගෙවීම් මෙන්ම වැටුප් හා වේතන සහ වර්තන පැවරුම් හා සහනාධාර සඳහා වූ වියදම් ඉහළ යෑම ඒ සඳහා මූලික වශයෙන් හේතු විය. මේ අතර, රාජ්‍ය ආයෝජන වැඩසටහන ක්‍රමවත් සහ ප්‍රමුඛතා පදනම මත සිදු කිරීම පිළිබිඹු කරමින්,

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණයදීම් 2015 වසරේ වාර්තා වූ සියයට 5.4 සිට 2016 වසරේ දී සියයට 4.9 දක්වා අඩු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය ආයෝජන 2015 වසරේ පැවති සියයට 5.5 සිට 2016 වසරේ දී සියයට 5.0 දක්වා අඩු විය. වසර තුළ දී රුපියල් බිලියන 640.3 ක් වූ සමස්ත අයවැය හිඟයෙන් වැඩි ප්‍රමාණයක් විදේශීය මූලාශ්‍රවලින් මූල්‍යනය කරන ලදී. ඒ අනුව, සමස්ත මූල්‍යනයෙන් සියයට 61.2 ක් සඳහා විදේශීය මූලාශ්‍ර දායක වූ අතර, ඉතිරිය දේශීය මූලාශ්‍රවලින් පියවන ලදී. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් මධ්‍යම රජයේ ණය ප්‍රමාණය 2015 වසර අවසානය වන විට පැවති සියයට 77.6 සිට 2016 වසර අවසානය වන විට සියයට 79.3 දක්වා ඉහළ ගියේය. ශුද්ධ ණය ගැනීම් ඉහළ යෑම සහ ආර්ථික වර්ධනය මන්දගාමී වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය ප්‍රමාණයෙහි නාමික අගය 2015 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 8,503.2 සිට 2016 වසර අවසානයේ දී රුපියල් බිලියන 9,387.3 දක්වා ඉහළ ගියේය. 2016 වසර අවසානයේ දී මධ්‍යම රජයේ නොපියවූ මුළු දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 5,341.5 දක්වා සියයට 7.7 කින් ඉහළ ගිය අතර, නොපියවූ විදේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 4,045.8 දක්වා සියයට 14.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. විවිධ වැඩිදියුණු වීම් මධ්‍යයේ වුවද බදු පරිපාලනයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ පැවති මන්දගාමීත්වය රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඩුවීම කෙරෙහි බලපෑවේය. එසේම, පොලී ගෙවීම්, වැටුප් හා වේතන සහ ගෘහ කුටුම්බ සඳහා වන සහනාධාර හා පැවරුම් ඇතුළත් පුනරාවර්තන වියදම්වල යම් අඩු වීමක් දැකිය හැකි වුවද, එම වියදම් ඉහළ අගයක පැවතිණි. තවද, දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළවල පොලී අනුපාතික ඉහළ යෑමත්, ප්‍රධාන විදේශ මුදල් වර්ගවලට එරෙහිව රුපියල අවප්‍රමාණයට ලක්වීමත් හේතුවෙන් ණය සඳහා දැරිය යුතු පිරිවැය ඉහළ යෑම නිසා රාජ්‍ය මූල්‍ය අංශය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති විය. මෙම ප්‍රවණතාව සහ කෙටිකාලීන හා මැදිකාලීන පරිණතවීම් කාලයක් සහිත විදේශීය වාණිජ ණය සැලකිය යුතු ප්‍රමාණයක් ඒකරාශී වීම තුළින් පැහැදිලි වන්නේ රාජ්‍ය මූල්‍ය හා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ නිසිකලට කඩිනමින් ක්‍රියාත්මක කිරීම තුළින් තිරසාර රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියක් සඳහා ජාතික එකඟතාවක් අවශ්‍ය බවයි.

***මුදල් ප්‍රතිපත්තිය සහ මුදල් අංශයේ වර්ධනයන්*** **: ආර්ථිකය තුළ ඉල්ලුම් පීඩන අධික ලෙස ඉහළ යෑමට ඇති හැකියාව සීමා කිරීම තුළින් ආර්ථික ස්ථායීතාව ඇති කිරීමේ අරමුණ ඇතිව 2016 වසර තුළ දී මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදී.** 2016 වසර තුළ දී රජයට සහ පෞද්ගලික අංශයට සපයන ලද ණය ප්‍රමාණයෙහි අධික ප්‍රසාරණය හේතුවෙන් මුදල් සමස්ත පුරෝකථනය කරන ලද මට්ටමට වඩා ඉහළ වේගයකින් වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව 2015 වසර අවසානයේ සිට මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීමට කටයුතු කළේය. ඒ අනුව, පළමුව, දේශීය මුදල් වෙළඳපොළ තුළ පැවති අධි ද්‍රවශීලතාව ස්ථිර පදනමකින් අවශෝෂණය කිරීම සඳහා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලුම රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 2016 වසරේ ජනවාරි මස 16 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රතිශතාංක 1.50 කින් සියයට 7.50 දක්වා ඉහළ නංවන ලදී. තවද, ඉහළ යමින් පැවති උද්ධමන පීඩනය හේතුවෙන් මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) 2016 පෙබරවාරි මාසයේ දී පදනම් අංක 50 කින්, පිළිවෙළින්, සියයට 6.50 සහ සියයට 8.00 දක්වා ඉහළ නැංවීය. දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මධ්‍යයෙහි වුවද, පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය අඛණ්ඩව වර්ධනය වූ අතර, වැඩි වශයෙන් බදු සංශෝධනවල බලපෑම සහ සැපයුම් අංශයේ ඇතිවූ අවහිරතා හේතුකොට ගෙන උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. උද්ධමන පීඩන ඉහළ යෑම මැඩපැවැත්වීම සහ ගෙවුම් තුලනය යහපත් බවට පත්කිරීමට සහාය වීම සඳහා

2016 ජූලි මාසයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, සියයට 7.00 සහ සියයට 8.50 දක්වා පදනම් අංක 50 බැගින් ඉහළ නැංවීම තුළින් මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් දැඩි කළේය. දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමග විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම, එක්දින පොලී අනුපාතික ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවෙහි පවත්වා ගැනීමට හේතු විය. 2015 වසර අවසාන කාලයේ දී අනුගමනය කරනු ලැබූ සාර්ව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග මෙන්ම, 2016 වසර තුළ දී විනිමය අනුපාතිකය නම්‍යශීලීව තීරණය වීමට ක්‍රමානුකූලව ඉඩහැරීම මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා උපකාරී විය. ආර්ථිකයේ පැවති දැඩි මුදල් තත්ත්වය පිළිබිඹු කරමින් 2016 වසර තුළ දී වෙළඳපොළ පොලී අනුපාතික ඉහළ ගියේය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය වර්ධනයෙහි යම් අඩු වීමක් පෙන්නුම් කළ ද, විශේෂයෙන්ම 2017 මුල් කාලයේ දී සැපයුම් අංශයේ අවහිරතා සහ බදු ඉහළ යෑම නිසා උද්ධමනය ඉහළ යෑම හමුවේ මහ බැංකුව 2017 මාර්තු මාසයේ දී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කළේය. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී ඉදිරි කාලීන දැක්මකින් යුතුව කටයුතු කිරීමේ නැඹුරුවකින් යුතුව මහ බැංකුව විසින් කල්ඇතිව අනුගමනය කරන ලද මෙම ක්‍රියාමාර්ග හේතුවෙන් අහිතකර උද්ධමන අපේක්ෂා ඇති වීම වැළැක්වීමත්, අහිතකර අපේක්ෂාවල පසු බලපෑම අවම කිරීමත් අපේක්ෂා කෙරේ.

**රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයටම සපයන ලද ණය ප්‍රමාණයෙහි ප්‍රසාරණය හේතුවෙන් පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) 2016 වසර තුළ දී පුරෝකථනය කළ අගයට වඩා ඉහළ වේගයකින් අඛණ්ඩව වර්ධනය විය.** ඒ අනුව, 2015 වසර අවසානයේ දී සියයට 17.8 ක අගයක් වාර්තා කළ පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2016 දෙසැම්බර් මාසය අවසානය වන විට සියයට 18.4 ක් වූ අතර, පුළුල් මුදල් සැපයුමේ සාමාන්‍ය වර්ධනය සියයට 18.1 ක ඉහළ මට්ටමක පැවතිණ. පෙර වසරේ දක්නට ලැබුණු ප්‍රවණතාව වෙනස් වී 2016 වසර තුළ දී පුළුල් මුදල් සැපයුමේ වර්ධනය සඳහා හේතු වූයේ බැංකු අංශයේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑමයි. කෙසේ වෙතත්, සියයට 92 ක පමණ දායකත්වයක් සපයමින් බැංකු අංශයේ ශුද්ධ දේශීය වත්කම් තවදුරටත් පුළුල් මුදල් සැපයුමේ ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. මේ සඳහා රජය සහ පෞද්ගලික යන දෙඅංශයට සපයන ලද ණය ප්‍රමාණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුව ද, විශේෂයෙන්ම, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායන්හි යහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් බැංකු අංශය විසින් රාජ්‍ය සංස්ථාවලට සපයන ලද ණය ප්‍රමාණය 2016 වසර තුළ දී පහළ ගියේය. 2016 වසර තුළ දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණය අඛණ්ඩව ඉහළ ගිය අතර, වසරේ අවසාන භාගය තුළ එම ණය වර්ධනයෙහි කිසියම් මන්දගාමී වීමක් දක්නට ලැබුණි. 2015 වසර අවසානයේ සියයට 25.1 ක් වූ පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය 2016 ජූලි මාසයේ දී සියයට 28.5 ක ඉහළම වර්ධනයක් වාර්තා කළ අතර, මහ බැංකුව විසින් අනුගමනය කරන ලද මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර දක්වමින්, 2016 වසර අවසානය වන විට එය සියයට 21.9 ක් දක්වා පහළ ගියේය. පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය ප්‍රමාණයෙහි ප්‍රසාරණය පෙර වසරේ පැවති රුපියල් බිලියන 691.4 හා සැසඳීමේ දී 2016 වසරේ දී රුපියල් බිලියන 754.9 ක් විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත සපයන ලද ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණයට අනුව, 2016 වසර තුළ දී ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශ සඳහා සපයන ලද ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

***මූල්‍ය අංශයේ වර්ධනයන්*** **: විදේශීය හා දේශීය යන දෙඅංශයෙහිම පවතින අභියෝගාත්මක වෙළඳපොළ තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින්, ආර්ථිකයෙහි මූල්‍ය අංශය වසර තුළ දී තවදුරටත් පුළුල් විය.** 2016 වසර තුළ දී පැවති දැඩි මුදල් තත්ත්වය පිළිබිඹු කරමින් 2015 වසරට සාපේක්ෂව බැංකු අංශයේ වත්කම් මන්දගාමී ලෙස වර්ධනය වූ අතර, බැංකු අංශය විසින් අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතා මට්ටමට වඩා ඉහළින් ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව පවත්වා ගනු ලැබීය. ණය සහ අත්තිකාරම් ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ වත්කම් පදනම සියයට 12.0 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන්, විදේශීය මූලාශ්‍රවලින් ලබාගත් ණය අඩුවීම හේතුවෙන් බැංකු අංශය විසින් ලබාගත් ණය සියයට 3.5 කින් අඩු වුවද, ඉහළ පොලී අනුපාතික වාතාවරණයක් යටතේ කාලීන තැන්පතු වර්ධනය වීම හේතුවෙන් 2016 වසර තුළ දී බැංකු අංශයේ තැන්පතු සියයට 16.5 කින් ඉහළ ගියේය. බැංකු අංශයෙහි ශුද්ධ පොලී ආදායමේ ඉහළ යෑම පිළිබිඹු කරමින් වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ මගින් ගණනය කරනු ලබන බැංකු අංශයෙහි ලාභදායිත්වය 2016 වසර තුළ දී වර්ධනය විය. මේ අතර, බැංකු අංශය විසින් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් අවම නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනු ලැබූ අතර, වසර තුළ දී විචක්ෂණශීලී ලෙස අවදානම් කළමනාකරණය අඛණ්ඩව සිදු කෙරිණ. පසුගිය දශක දෙක තුළ දී අක්‍රීය ණය අනුපාතයේ වාර්තා කළ අවම අගය සනිටුහන් කරමින් 2016 වසරේදී වත්කම්වල ගුණාත්මකභාවය වර්ධනය වී ඇත. මේ අතර, නව බැංකු ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර පහසුකම් ඇති කිරීම තුළින් බැංකු අංශය සිය මෙහෙයුම් කටයුතු පුළුල් කිරීමට කටයුතු කරන ලදී. 2016 වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වල වත්කම් සහ ශාඛා ජාලයෙහි වර්ධනයක් වාර්තා විය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් රථ වාහන සඳහා මූල්‍ය පහසුකම් සැපයීම සඳහා වූ සිය ප්‍රධාන ව්‍යාපාර කටයුත්තෙන් ක්‍රමයෙන් බැහැර වී අනෙකුත් ණය උපකරණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් 2016 වසරේදී සිය වත්කම් පදනම පුළුල් කරගෙන ඇත. නම්‍යශීලීභාවය හා පිරිවැය සලකා බලා සුළු පරිමාණ තැන්පතුවල සිට බැංකු ණය ලබාගැනීම කෙරෙහි මෙම අංශය ක්‍රමයෙන් යොමු වීම නිසා, දේශීය ණය මගින් මෙම වර්ධනය ප්‍රධාන වශයෙන් මූල්‍යනය කර ඇත. ව්‍යාපාර කටයුතුවල ප්‍රසාරණය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි වීමත් සමඟ මධ්‍යස්ථ ලෙස ඉහළ නැංවුණු ශුද්ධ පොලී ආදායම හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වල ලාභදායිත්වය 2016 වසරේ දී ඉහළ ගියේය. අක්‍රීය ණය, ද්‍රවශීලතාව සහ ප්‍රාග්ධනය යහපත් මට්ටමක පැවතීම තුළින් පිළිබිඹු කෙරෙන පරිදි, එම අංශයේ අවදානම් සමස්තයක් වශයෙන් මනාව කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතුණි. මේ අතර, රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සමස්ත ආයෝජන කළඹ මෙන්ම, සමස්ත වත්කම් ප්‍රමාණය ද පහළ ගියේය. කෙසේ වුවද, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සමස්ත ප්‍රාග්ධනය සහ ලාභදායිත්වය වර්ධනය විය. 2016 වසරේ දී ඒකක භාර අංශයෙහි සමස්ත වත්කම් මෙන්ම, නිකුත් කළ ඒකක භාර සංඛ්‍යාවේ පහළ යෑමක් වාර්තා විය. ඒකක භාර විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, කොටස් වෙළඳපොළ ආයෝජන සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, 2016 වසරේ දී රක්ෂණ අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය ඉහළ ගිය අතර, දිගුකාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ යන ව්‍යාපාර අංශ දෙකම මේ සඳහා දායක විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ඉහළ වර්ධනය හේතුවෙන් රක්ෂණ අංශයේ සමස්ත ලාභ ඉපැයීම 2016 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2016 වසරේ විශ්‍රාම අරමුදල් අංශයේ සමස්ත වත්කම්වල සාමාන්‍ය වර්ධනයක් පෙන්නුම් කළ අතර, මෙම වර්ධනය ආයෝජන මගින් ඉපැයූ ආදායම ඉහළ යෑම සහ සාමාජික ශුද්ධ දායක මුදල් ලැබීම්වල ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය.

**මූල්‍ය අංශයෙහි ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය වර්ධනය කිරීම මගින් මහජනයාගේ විශ්වසනීයභාවය වැඩිදියුණු කිරීමේ අදහස පෙරදැරිව ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුළු නියාමන ආයතන විසින් මූල්‍ය ආයතන සඳහා වන අධීක්ෂණ හා නියාමන රාමුව ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කරන ලදී.** බාසල් III සම්මුතිය යටතේ මහ බැංකුව විසින් 2017 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී බැංකු සඳහා වන ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නංවන ලදී. නියාමන ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ අවදානම් කළමනාකරණය පිළිබඳ මූලික තොරතුරු ප්‍රසිද්ධ කරනු ලබන මූල්‍ය ප්‍රකාශ මගින් අනාවරණය කරන ලෙසත්, මුදල් පැවැරීම්වලදී අයකරනු ලබන ගාස්තු පිළිබඳ වැඩි තොරතුරු ලබාදෙන ලෙසත්, සියලු බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදී. එසේම, අන්තර්ජාල ගනුදෙනු හා සම්බන්ධ සයිබර් ආරක්ෂණය සම්බන්ධව මතුවන්නා වූ අවදානම් සඳහා පිළියම් යෙදීමේ අරමුණින් සයිබර් ආරක්ෂණ සිද්ධි පිළිබඳ වාර්තා මහ බැංකුවට සපයන ලෙස සියලු බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. එමෙන්ම, විනිවිදභාවය සහ මිල අනාවරණය ඉහළ නැංවීම මගින් බැංකු අංශය තුළ රාජ්‍ය සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ප්‍රවර්ධනයට ක්‍රියාමාර්ග ගනු ලැබීය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් පිළිබඳ සැලකීමේ දී, මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණින් මූල්‍යමය වශයෙන් දුර්වල තත්ත්වයේ පසුවන මූල්‍ය ආයතන යළි නගාසිටුවීම සඳහා නියාමන ක්‍රියාමාර්ග ගන්නා අතරම, දේශීය මෙන්ම විදේශීය සම්මත සහ ක්‍රියාපටිපාටිවලට අනුකූලව විචක්ෂණශීලී ක්‍රියාමාර්ග ගැනීම මහ බැංකුව විසින් අඛණ්ඩව සිදුකරන ලදී. මේ අතර, නියාමනය නොකරන ලද ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ රාජ්‍ය නොවන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය කිරීමේ අරමුණු ඇතිව අලුතින් නීතිගත කරන ලද 2016 අංක 6 දරන ක්ෂුද්‍ර මූල්‍ය පනතෙහි විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සඳහා නියාමන රාමුවක් 2016 වසරේ දී හඳුන්වා දෙන ලදී. රක්ෂණ ව්‍යාපාරයේ වෘත්තීය මට්ටම සහ කීර්තිනාමය ප්‍රවර්ධනය කරන අතරම, රක්ෂණ ඔප්පු හිමියන්ගේ ප්‍රතිලාභ සුරැකීම සඳහා 2016 වසරේ දී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබීය.

***ඉදිරි දැක්ම* : අපේක්ෂා කරනු ලබන පරිදි ශ්‍රී ලංකා ආර්ථිකය ඉහළ වර්ධන මාවතක් තුළ ස්ථාවර ලෙස රඳවා ගැනීමට නම් ආර්ථිකය තුළ දිගුකාලීනව පවතින ව්‍යුහාත්මක ගැටලු විසඳිය යුතු බව 2016 වසරේ ශ්‍රී ලංකා ආර්ථිකයෙහි ක්‍රියාකාරිත්වය තුළින් යළි අවධාරණය විය.** මෙම ගැටලු මෙන්ම ආර්ථිකයෙහි ඉස්මතු වෙමින් පවතින අභියෝග විසඳීම සඳහා ද අවශ්‍ය කරනු ලබන ප්‍රතිපත්ති සැකසීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි බහුපාර්ශ්වීය ආයතනවල ද සහයෝගය සහිතව, රජය විසින් මෑතක දී ගෙන ඇති ක්‍රියාමාර්ග පැසසිය යුතු අතර, ගෝලීය නිෂ්පාදන ජාලය සමඟ සමීපව ඒකාබද්ධ වෙමින්, ආර්ථිකයෙහි ඵලදායිතාව හා කාර්යක්ෂමතාව ඉහළ නැංවීමටත්, සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හා දේශීය පෞද්ගලික අංශයෙහි ආයෝජන දිරිමත් කිරීමටත් හේතු වන පරිදි එම ප්‍රතිපත්ති නොපමාව හා ස්ථාවර ලෙස ක්‍රියාත්මක කළ යුතු වේ. ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දී ඇති ව්‍යුහාත්මක අභියෝග පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව පසුගිය වාර්ෂික වාර්තා මගින් මෙන්ම, රජය වෙත ඉදිරිපත් කරන ලද වාර්තා මගින් නිබඳවම අවධාරණය කර ඇති අතර, ආර්ථික පර්යේෂණවල නියැළෙන්නන් සහ අන්තර්ජාතික සංවර්ධන නියෝජිත ආයතන විසින් ද විවිධ අවස්ථාවල දී ඒ බව අවධාරණය කර ඇත. රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම තුළින් සහ ඉදිරි දැක්මකින් යුතු මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ඔස්සේ සාර්ව ආර්ථික මූලධර්ම ශක්තිමත් කරමින්, මෙම ව්‍යුහාත්මක ගැටලු සඳහා පුළුල් මහජන එකඟතාවකට අනුව නොපමාව විසඳුම් සෙවිය යුතු අතර, තිරසාර හා වර්ධනයේ ප්‍රතිලාභ සියලු පුරවැසියන් වෙත හිමිවන ආකාරයේ වර්ධන මාවතක ආර්ථිකය ගමන් කිරීමේ දී මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදු කිරීම තවදුරටත් ප්‍රමාද කිරීම සිදු නොකළ යුතුය.